

# 'ළදැරිය, දැරිය, යෞවනිය, තරුණිය, පතිනිය, මිත්තණිය'

මිනිස් ප්‍රජාවගේ ස්ථාවර ඉදිරි පැවැත්ම උදෙසා ස්වභාවධර්මය විසින් ස්ත්‍රී.පුරුෂ දෙපක්ෂයේ සමබර බව පිළිබඳව ද වගබලා ගැනීමක් සිදු වීම සනාතන ස්වභාවයකි. ඒ අනුව කවර සමාජයක් තුළ වුවද කාන්තාව හා පුරුෂයා එකතු වෙමින් පවුල් ජීවිත ගෙවීම සාමාන්‍ය ස්වභාවයයි. කරුණු මෙසේ වුවද, එදා මෙදාතුර, ලෝක සංස්කෘතීන්හි පැවති විවිධ ආකල්ප අනුව බොහෝ විට ගැහැනිය යම් තරමක් දුරට හෝ අවතක්සේරු වීමට ලක්ව සිටින බව ද පිළිගත හැකි කරුණකි.

කාන්තාව වූ කලී පුරුෂයාට සාපේක්ෂව බලන විට සුන්දරත්වයේ ප්‍රතිමූර්තියක් ලෙස සැලකීම එදා මෙදාතුර සිදු වී ඇත. සිංහල සාහිත්‍යයෙන් මේ සඳහා කොතෙකුත් නිදසුන් සොයාගත හැකිය. එවන් කාන්තාව උපතේ සිට ජීවිතයේ අවසානය දක්වාම සමාජය තුළ, පවුල තුළ කෙබඳු තත්වයක් හිමි කර ගන්නීද, කවරාකාරයේ භූමිකාවන්හි නිරත වී සිටින්නීද යන්න විමසා බැලීම සඳහා ගැහැනියකගේ ජීවිතයේ විවිධ අවස්ථා, ළදැරිය, දැරිය, යෞවනිය, තරුණිය, පතිනිය සහ මිත්තණිය යනාදී වශයෙන් විමර්ශනය කළ හැකිය. විශේෂයෙන්ම සිංහල සංස්කෘතිය තුළ මෙන්ම අපරදිග සංස්කෘතික පසුබිම්වල ද ඒ එක් එක් කාල වකවානු ගෙවන කාන්තාවන් ලබන අත්දැකීම් හා මුහුණපාන අවස්ථා විවිධ බව කිව හැකිය.

ශ්‍රී ලාංකික සිංහල සංස්කෘතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන විට පැරණි හා නූතන අවදිවල දක්නට ලැබෙන සමවිෂමතා කෙරෙහි ද සැලකිලිමත් විය යුතුව ඇත. පැරණි සිංහල සමාජය පොදුවේ ගත් විට පවුලට සිදු වන දරු උපතකදී පුත්‍රයකුගේ උපත වඩාත් ඉහළින් අපේක්ෂා කළ දෙයයි. වින්නඹු මාතාව තිඹිරි ගෙය තුළ සිට, ගැබිණියගේ දරු ප්‍රසූතිය සඳහා සිය වගකීම් ඉටු කර අවසානයේදී දරුවාගේ ප්‍රබල හඬ නිවස පුරා පැතිරී යද්දී සියල්ලන්ගේම අවධානය දරුවා පිරිමිද ගැහැනුද යන්න දැනගැනීමටයි. වින්නඹු මාතාව හෝ වෙනත් වැඩිහිටි කාන්තාවක් දරු ප්‍රසූතිය කෙළවර දොර හැර එළියට එන විට පවසන වදන් දෙකක් ඇත. එක්කෝ 'සරමක්' නැතහොත් 'කම්බායක්' යන දෙකෙන් එකක් ඇය පවසන්නේ ඉතා උද්යෝගයෙන් බලා සිටින පවුලේ ඥාතීන්ට දරු උපත පිළිබඳ අත්‍යවශ්‍ය කරුණු දැන්වීමටය. 'සරමක්' යනුවෙන් ඇය කීවොත් එයින් අදහස් වන්නේ උපන් දරුවා පුතකු බවයි. 'කම්බායක්'




යන්නෙන් සංකේතවත් කරනුයේ ගැහැනු දරුවකු උපන් බවයි. ගැහැනුන්ගේ හා පිරිමින්ගේ ඇඳුම්වල වෙනස, එනම් පිරිමින් අඳින සරම හා ගැහැනුන් (එදා ගැමි සමාජයේ විශේෂයෙන්ම) ඇඳි කම්බාය සංකේත ලෙස දක්වමින් බලා සිටින්නන්ට අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීම එකල මෙලෙසට සිදු විය. මේ හැරුණ විට ඇතැම් උඩරට පළාත්වල දරු උපත පිරිමිද ගැහැනුද යන්න සංකේතවත් කෙරුණේ මෝල්ගසක් හෝ ගොවිතැනේදී භාවිත කෙරෙන භාණ්ඩයක් වහළට උඩින් ගෙයි පිටුපසට වීසි කර දැමීමෙනි. ගැහැනියට ගෙදර වැඩ සඳහා අවශ්‍ය වන මෝල්ගස හෝ පිරිමින්ට කුඹුරු වැඩවලදී අවශ්‍ය වන භාණ්ඩයක් මේ සඳහා යොදාගැනීම එකල සිරිතක්ව පැවති බව කියවේ.

පිරිමි දරුවකුගේ උපත පවුලට ශක්තියක් ලබා දෙන අතර අනාගතයේදී පරම්පරාව, පවුලේ නම ගෙනයාම සඳහා ද එය අවශ්‍ය ලෙස සැලකිණ. පිතෘමූලික සමාජයක දරුවාට ලැබෙන්නේ පියාගේ වාසගමයි. අලුත ඉපදෙන දරුවා ගැහැනු දරුවකු වුවහොත් ඇය ද පියාගේ වාසගම හිමි කරගන්නා නමුත් ඇය විවාහ වී දරුවන් ලබන විට ඇයගේ සැමියාගේ වාසගම යොදාගැනේ. එලෙසින් ගත් විට දියණියක් විවාහ වීමේදී හා දරුවන් ලැබීමේදී ස්වාමිපුරුෂයාගේ පාර්ශ්වයට ප්‍රධාන තැන ලැබෙන බැවින් පවුලක පියකුට තම නම ඉදිරියට ගෙන යාමට නම් පුතකුගේ උපත වැදගත්ය. එලෙසින්ම ගොවිතැන් හා වෙනත් කටයුතුවලදී දියණියකට වඩා පුතකුගේ ශක්තිය පවුලකට අවශ්‍ය ලෙස එදා සමාජය සැලකූ නිසා පිරිමි දරු උපත් වඩාත් දුරට අපේක්ෂා කළ බව කිව හැකිය.
එය එසේ වුවද, ඉහත කී පරිදි, මානවයාගේ ඉදිරි පැවැත්මට අවශ්‍ය වන සේ ස්ත්‍රී.පුරුෂ උපත් සමබරව සිදු විය යුතු නිසාම හැම පවුලකටම (විශේෂ අවස්ථා හැරුණ විට) ගැහැනු පිරිමි දරුවන්ගේ උපත සිදු වීම ස්වාභාවිකය. පුතුන්ගේ උපත වැඩි අවධානයකින් යුතුව අපේක්ෂා කළ නමුදු එදා සිංහල සමාජය තුළ දියණිය පිළිබඳ පැවති ආකල්ප ද අඩුවෙන් තක්සේරු කළ හැකි නොවේ.

'දියණියක් නිවසක ශ්‍රියා කාන්තාව වැනිය', 'නිවස ආලෝකවත් කරන පහන වැනිය' යනාදී කියමන් ද එකල සිංහල සමාජය තුළ ප්‍රචලිතව පැවතිණ. ගැහැනු.පිරිමි භේදය කෙසේ වෙතත් නිවසක 'අම්මා' යනු අඩු නැතිවම කාගේත් ආදරය ගෞරවය දිනාගත් තැනැත්තිය වූ බවට සිංහල ජනකවිවලින් ද සොයාගත හැකි සාක්ෂි අපමණය.

"වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්
ගොල්ලේ පිපෙන පන්මල වාසනාවන්
පෝයදාට පුන්සඳ වාසනාවන්
ජාතිත් අපේ අම්මා වාසනාවන්"

මෙවන් අරුත් දෙන ජනකවි, සිංහල ජන සාහිත්‍යයේ අප්‍රමාණව දක්නට ඇත.

"රෑ වෙනවා නොදැනෙයි අම්මා නැතුව
එළි වෙනවා නොදැනෙයි කුකුළා නැතුව
හොරු එනවා නොදැනෙයි බල්ලා නැතුව
මගේ ගෙදර අඳුරුයි අම්මා නැතිව"

මෙලෙසින් මව් පදවියට පත්ව පවුලේ දරුවන් හා සැමියා රැක බලාගන්නා මාතාවට සමස්ත සමාජය තුළම අපමණ ගරුත්වයක් හිමි වෙයි. එසේ වුවද පවුලට උපදින ළදැරිය ගැන යම් තරමකට හෝ අවතක්සේරුවක් සිදු වන අවස්ථා ද නැත්තේ නොවේ.

අප අතර තිබෙන දරු නැළවිලි කවි ගෙන බලන විට පොදුවේ ළදරුවන් හා ළදැරියන්ට අදාළව කියවෙන කවි මෙන්ම ළදැරියන් වෙනුවෙන් වෙනම කියවෙන කවි ද දක්නට ඇත. මතු දැක්වෙන්නේ එවැන්නකි.

"අතට වළලු කොහෙන් දුවේ
පයට ගිගිරි කොහෙන් දුවේ
ඉණට හවඩි කොහෙන් දුවේ
දැනට නිදා ගනින් දුවේ"

එසේ වුවද මේ හා සමානම කවියක් "අතට වළලු කොහෙන් පුතේ" යනුවෙන් භාවිත වන බව ද කියවේ. එකල ගැමි සමාජය තුළ ළදැරියන්ට මෙන්ම ළදරුවන්ට ද වළලු මාල වැනි රන් අබරණ පැළඳවීම සිරිතක් වූ නිසා එවැනි කවි අසාමාන්‍යය ඒවා නොවන බව කිව හැකිය.

ළදැරිය පවුල තුළ උපත ලද මොහොතේ පිරිමි දරුවකු නම් වඩාත් හොඳ යයි කල් ඇතිව සිතා සිටි දෙමාපිය වැඩිහිටියන් වුවද තම දරුවාට ගැහැනු.පිරිමි භේදයකින් තොරව ආදරය දැක්වීම සාමාන්‍යයෙන් සිදු වෙයි. ළදැරියකගේ උපත සිදු වූ පවුලක දෙමාපියන්ගේ හිත තුළ ඇයගේ අනාගතය ගැන වැඩි වශයෙන් බරක් ඇති වීමට ද ඉඩ ඇත. මෙය කරුණු දෙකක් නිසා සිදුවිය හැකිය. එක අතකින් බලන විට පවුලක් තුළ ගැහැනු දරුවකුගේ වැඩි ආරක්ෂාවක් අපේක්ෂා කෙරෙනුයේ ඇය විවාහ වන අවස්ථාව වන විට චරිතවත් තරුණියක ලෙස භාර දීම අත්‍යවශ්‍ය ලෙස සැලකුණ හෙයිනි.
විවාපත් වන තම දියණිය කවර හෝ හේතුවක ප්‍රතිඵල වශයෙන් කන්‍යාවක වී නොසිටියහොත් එහි අගෞරවය ඇයගේ පවුලටත් විශේෂයෙන්ම මවටත් යොමු වීම එකල සමාජ තත්වය අනුව පැවති විශ්වාසයකි. ඒ අනුව තම උකුලේ නිදියන ළදැරිය පිළිබඳව ද මවකගේ සිත තුළ වැඩි බරක් ඇති විය හැකිය.

ඊට අමතරව, ළදැරියකගේ උපත යනු අනාගතයේදී, ඇය විවාහ කර දෙන විට දායාද දීමට තරම් වත්කමක් දෙමාපියන්ට තිබිය යුතු බව මතක් වන අවස්ථාවකි. සිංහල සමාජයේ විවාහ ක්‍රමය තුළ මනාලිය විවාහ වී එන විට දායාද රැගෙන පැමිණීම අත්‍යවශ්‍ය සේ සැලකුණි. එසේ නොමැතිව හෝ අඩු ප්‍රමාණයක දායාද රැගෙන හෝ කුලගෙට පිවිසෙන තරුණියට කල් ගත වන විට නැන්දම්මා ඇතුළු පිරිසගෙන් අසන්නට ලැබෙන ඇනුම් බැණුම්වල කෙළවරක් නැත. මේ අයුරින් ගෙන බලන විට මෙලොවට බිහි වන ළදැරිය අනාගතයේදී දරුවන් බිහි කර පවුලේ අනාගතය සවිමත් කරන්නිය ලෙස සලකනු වෙනුවට ඉහත සඳහන් කරුණු දෙක හේතු කොටගෙන ළදැරියකගේ උපත පවුලට බරක් ලෙස සැලකීම අදටත් වඩා එදා සිංහල සමාජය තුළ සිදු වූ තත්වයයි.

ළදරු විය ගෙවමින් සිට කුඩා දැරියක් බවට පත් වන දියණිය සුන්දර ලෙස ඇඳුම් පැළඳුම්වලින් සරසා ඇය දෙස බලා සතුටු වන දෙමාපියෝ කොතරම් නම් සිටිත්ද? එසේ වුවද කුඩා දැරියගේ ආරක්ෂාව ගැන දෙමාපියන් සතුව ඇත්තේ වැඩි වගකීමකි. එපමණක් නොව, සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ පිරිමි දරුවනටත් වඩා ගැහැනු දරුවන් සංයමයෙන් හා මනා හැසිරීමකින් යුතුව හැදී වැඩෙන්නට සැලැස්වීම ද දක්නට ලැබුණි.




බටහිර සමාජවල ගැහැනු දරුවකුගේ හැසිරීම් රටාව පිරිමි දරුවකුගේ හැසිරීමට වඩා විනීත විය යුතුය යන දැඩි අපේක්ෂාවක් දක්නට නොලැබුණාද පෙරදිග සමාජවල එවැන්නක් අපේක්ෂා කෙරිණ. වෙනත් ඇතැම් විදේශ රටවල් ගැන සලකන විට නයිජීරියානු සමාජය වැනි සමාජයන්හි ගෝත්‍රික ජනතාව අතර පිරිමි දරුවකුට වඩා ගැහැනු දරුවකුගේ සංවර කම අපේක්ෂා කෙරුණ බවක් පෙනේ. නයිජීරියාවේ ඉබෝ ගෝත්‍රික ජනතාවගේ